ශාන්ත පීතර විදුහල - කොළඹ 04

පළමු වාර පරීක්ෂණ - 2020

06 ශ්‍රේණිය - පෙරදිග සංගීතය

කාලය පැය
1 1/2

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. "නාදය" _____ මාධ්‍යය වේ.

i. සංගීතයේ ii. නර්තනයේ iii. නාට්‍යයේ iv. චිත්‍රයේ

02. කිසියම් වූ අඩු හඬක් ඇති ස්වරයක සිට වැඩි හඬක් ඇති ස්වරයක් දක්වා ක්‍රමාණුකූලව හඬ ඉහළට ගමන් කිරීම,

i. අවරෝහණ වේ
ii. ආරෝහණය වේ
iii. ස්වර ස්ථාපන ගී වේ
iv. ළමා ගී වේ

03. "හොඳ දේ හිතමී" ගීතය,

i. ළමා ගීයකි
ii. නාට්‍ය ගීයකි
iii. ස්වර ස්ථාපන ගී වේ
iv. චිත්‍රපටි ගීයකි

04. C, D, E, F යන ස්වර වලට සමාන පෙරදිග ෂ්වර සංකේත මොනවාද?

i. ස,ග,රි,ම ii. ග,ස,ම,රි iii. රි,ග,ම,ප iv. ස,රි,ග,ම

05. පෙරදිග සංගීතයේ "ස" ස්වරය බටහිර සංගීතයේ හඳුන්වන ස්වර නාමය වන්නේ,

i. Fa ii. Re iii. Mi iv. Do

06. පෙරදිග සංගීතයේ ශුද්ධ ස්වර ගණන,

i. පහකි ii. නවයකි iii. හතකි iv. අටකි

07. භාරතීය සංගීතයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ,

i. අපරදිග හා දකුණු ඉන්දීයයි
ii. හින්දුස්ථානි හා කර්ණාටකයි
iii. පෙරදිග හා අපරදිගයි
iv. පෙරදිග හා උතුරු ඉන්දීයයි

08. සංගීතයේ අමිහිරි නාද _____ වශයෙන් හැඳින්වේ.,

i. ශබ්ද ii. නාදය iii. ස්වර iv. තාල

09. පෙරදිග සංගීතයේ දී "ප" ස්වර සංකේතය හඳුන්වන ස්වර නාමය වන්නේ,

i. පංචමය ii. ධෛවතය iii. නිෂාදය iv. ගාන්ධාරය

10. "නිල් අහස් තලේ අගේ" ගීතය,

i. දේශාභිමානී ගීතයකි
ii. ළමා ගීතයකි
iii. සරළ ගීතයකි
iv. උපදේශාත්මක ගීතයකි

(ලකුණු 2×10=20)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

කෙටි පිළිතුරු ලියන්න.

01. ශුද්ධ ස්වර හත පිළිවෙලින් ලියන්න.

_____

02. නර්තනයේ හා චිත්‍රයේ මාධ්‍යය ලියන්න.

_____

03. සම කම්පනයෙන් හඬ නිපදවන සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න.

i. _____ ii. _____

04. ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න.

i. _____ ii. _____

05. මැයි මාසයේ හා දෙසැම්බර් මාසයේ පවත්වනු ලබන ආගමික උත්සව දෙක පිළිවෙලින් නම් කරන්න.

මැයි _____ දෙසැම්බර් _____

(ලකුණු 2×5=10)

හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

01. ස නි ධ ප ම ග රි යන්න අවරෝහණ පිළිවෙලයි. ( )

02. තබ්ලාව අපරදිග සංගීත භාණ්ඩයකි. ( )

03. නාට්‍යයේ මාධ්‍යය අභිනය වේ. ( )

04. "එකට සතුටු සාගරේ" ගීතය හින්දි ගීතයකි. ( )

05. රිෂභය ලෙස හඳුන්වන්නේ "රි" ස්වරයයි. ( )

(ලකුණු 2×5=10)

II කොටස

සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ඔබ උගත් ස්වර ස්ථාපන ගීතයක ස්වර සහ වචන ප්‍රස්තාර කර දක්වන්න. **(ලෙ. 10)**

02. පෙරදිග ස්වර නාම හා සංඥා සහ අපරදිග ස්වර නාම හා සංඥා වගු සටහනේ දක්වන්න. **(ලෙ. 20)**

03. ආරෝහණ සහ අවරෝහණ යන්න කුමක්දැයි උදාහරණ සහිතව ලියා දක්වන්න. **(ලෙ. 10)**

04. සංගීතය යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලෙ. 10)**

05. විවිධ වූ කලා විෂයන් හි මාධ්‍යයන් වෙන වෙනම නම් කරන්න. **(ලෙ. 10)**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“An investment in knowledge pays the best interest.” — Benjamin Franklin



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only